ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023-01-09

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | එච්. එම්. මුසම්මිල් මයා.<br>අංක 443/ඒ/1. උලහිටිවල.<br>මල්වාන. |
| වගඋත්තර පාර්ශවය | :01. | බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.<br>පළාත් අධ්‍යාපන කාර්යාලය.<br>ආනන්ද කුමාරස්වාමි මාවත.<br>කොළඹ 07. |
| | 02. | එම්.ආර්.ඒ.එස්.එම්. බණ්ඩාර මයා.<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් පාලන)<br>කැළණිය අධ්‍යාපන කලාපය.<br>සපුගස්කන්ද. |
| | 03. | එම්.පී.එම්. උස්මාන් මයා.<br>විදුහල්පති.<br>අල්මහමූද් විද්‍යාලය.<br>උලහිටිවල. මල්වාන. |

<u>පැමිණිලි අංකය : HRC/1827/17</u>

පැමිණිල්ල=:

පෙත්සම්කරු වන හසයීන් මොහොමඩ් මුසම්මුල් යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2017-05-24 දිනැතිව මෙම පෙත්සම ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම දියණිය මල්වාන උලහිටිවල අල්මහමූද් විද්‍යාලයේ 11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර, තමා සමග පවතින පෞද්ගලික අමනාපකම් හේතුකොටගෙන විද්‍යාලයේ විදුහල්පති විසින් තම දියණියගෙන්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පෞද්ගලික පළිගැනීම් සිදු කර මානසික පීඩාවට ලක් කිරීම හේතුවෙන් දියණිය පාසලෙන් ඉවත් කර ගැනීමට සිදුවූ බවයි.

මෙකී පැමිණිල්ල සමග පෙත්සම්කරු විසින් දිවුරුම් ප්‍රකාශයක් ද පෙත්සම්කරුගේ දියණිය වන එම්.එම්.එෆ්. මශ්ලහා විසින් කැළණිය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා අමතා ලියූ 2017-05-09 වන දිනැති ලිපියේ පිටපතක් ද අමුණා ඇත.

පෙත්සම්කරු ඔහුගේ ඉහත කී පෙත්සමට අමතරව ඔහු විසින් ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, මෙම පාසලට 2012 වර්ෂයේදී එම්.ටී.එම්. හුස්මාත් නැමැති නව විදුහල්පතිවරයකු පැමිණ ඇති අතර, එම විදුහල්පතිගේ බිරිඳද මෙම පාසලේ 05 ශ්‍රේණියේ ගුරුවරියක් බවත්, එසේම විදුහල්පතිගේ පුතකු ද මෙම පාසලෙහිම ඉගෙනුම ලබන ශිෂ්‍යයකු වන අතර, එම ශිෂ්‍යයාද පෙත්සම්කරුගේ දියණියගේ පංතියෙහි ඉගෙනුම ලබන බවත්ය. පෙත්සම්කරු පාසල් සංවර්ධන කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන කාලයේදී විදුහල්පති ලෙස කටයුතු කළ ඉහත තැනැත්තාගේ ඇතැම් තිරණ වලදී පෙත්සම්කරු විරෝධතාවය දැක්වීම, ඇතැම් අවස්ථාවලදී එකගතාවය පළ නොකර සිටීමෙන් පෙත්සම්කරු කෙරෙහි විරසකභාවයක් නිරතුරුවම විදුහල්පති තුළ පැවැතුණු බවත්, එකී විරසකභාවය පදනම් කරගෙන විදුහල්පති විසින් දිගින් දිගටම අවස්ථාවක් ලද සෑම විටකදීම පෙත්සම්කරුගේ දරුවාට වෙනස් කොට සැලකීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත. එසේම 2015 වර්ෂයේ පාසල් විද්‍යා විෂය සම්බන්ධව ප්‍රශ්න පත්‍ර බැලීමේ කටයුතු වලට විදුහල්පතිගේ දියණිය ද යොදා ගත් බවත්, එම කටයුත්ත තුළින් පෙත්සම්කරුගේ දරුවාගේ විභාග ප්‍රශ්නපත්‍ර වල විභාග ලකුණු අඩු කර තිබූ බවත් දන්වා ඇත.

එසේම, 2017.05.05 වන දින පෙත්සම්කරුගේ දරුවාට විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, විදුහල්පතිගේ බිරිඳ ඇතුළු කණ්ඩායමක් පැමිණ පංතිකාමරය තුළදී අනෙකුත් දරුවන් ඉදිරියේ බැණ තර්ජනය කළ බවද සඳහන් කර ඇත.

එකී හේතුවෙන් පෙත්සම්කරුට ඔහුගේ දරුවන් එම පාසලෙන් ඉවත් කිරීමට සිදු වූ බවද පවසා ඇත. පෙත්සම්කරු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, තමන්ගේ වැඩිමහල් දියණියට මෙවැනි පීඩාවකට ලක් වීමට ප්‍රධාන හේතුව වූයේ කාලයක් තිස්සේ විදුහල්පති ඔහු කෙරෙහි පැවැති පෞද්ගලික අමනාපකම් නිසා බවද සඳහන් කර ඇත.

පෙත්සම්කරු මෙම පෙත්සම ගොනු කිරීමෙන් බලාපොරොත්තු වන්නේ මල්වාන, අල්මහමූද් විද්‍යාලයේ විදුල්පති සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කිරීමට සහ ඔහුගේ පෙත්සම් පිළිබඳ පරීක්ෂණයක් සිදු කිරීම වේ.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු =:**

මෙකී පෙත්සම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2017-06-21, 2017.08.14, 2017.12.04, හා 2018.02.06 යන දිනයන්හිදී පරීක්ෂණ සිදු කර ඇති අතර, එකී පරීක්ෂණ වලදී වගඋත්තරකාර පාර්ශවය විසින් වාචිකව කරුණු ඉදිරිපත් කර ඇත. පෙත්සම්කරුද ඔහුගේ දුක්ගැනවිල්ල නැවත නැවතත් පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කර ඇත.

එම අවස්ථාවේදී පෙත්සම්කරු තවදුරටත් පවසා ඇත්තේ, 2017-05-05 වන දිනයේදී වගඋත්තරකාර විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති සමග පෙත්සම්කරුගේ දියණිය ඉගෙනුම ලබන 11 වන ශ්‍රේණියේ පංති කාමරට ඇතුළු වූ අවස්ථාවේදී ඔවුන් සමග පාසල් සංවර්ධන කමිටුවේ සාමාජික පිරිසක් සහ තවත් බාහිර පිරිසක් ද ඇතුළු වූ බවට චෝදනා කර ඇත.

තවද පෙත්සම්කරුගේ දියණිය බස්නාහිර පළාත් සමාජ විද්‍යා පිළිබඳ තරගයකින් පළමු වැනියා වූ බවත්, එකී පාසලෙන් ජයගත් දරුවන්ට පැවැති උදේ රැස්වීමේදී එම පාසලේම තුන් වන ස්ථානය ලබා ගත් ශිෂ්‍යාවට කරපළඳනාව පැළඳ වූ අතර, පෙත්සම්කරුගේ දියණියට එම කර පටිය අතට දුන් බවත්, එමගින් ඔහුගේ දියණිය අවමන් සහගත ලෙසට සැලකූ බවත් පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත.

පරීක්ෂණයේදී පෙත්සම්කරු මෙම චෝදනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී වගඋත්තරකාර විදුහල්පති පැමිණ සිටි අතර, එම චෝදනාව එම අවස්ථාවේදී ප්‍රතික්ෂේප කර නොමැත. මෙම පරීක්ෂණයේදී පිටස්තර පුද්ගලයන් පංතිකාමරය තුළට ගෙන යාම පිළිබඳව දෝෂාරෝපණය කළ අවස්ථාවේදී වගඋත්තරකරු නිහඬ පිළිවෙතක් අනුගමනය කරමින් සිට ඇත.

තවද, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවෙන් 2018-06-06 වන දින පරීක්ෂණයට පැමිණ සිටි නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය දන්වා ඇත්තේ, පෙත්සම්කරු විසින් තම දරුවාගේ අස්වීම් සහතිකය විදුහල්පතිවරයා විසින් ලබා නොදෙන බවට දක්වා ඇති බවත්, නමුත් මේ වන විට පෙත්සම්කරුගේ දරුවා පාසලෙන් අස්කර ගෙන ගොස් ඇති බැවින්, එම ගැටළුව විසඳී ඇති බවත්ය.

**නිරීක්ෂණ හා නිගමනය =:**

ඉහත කී සියලු කරුණු කාරණා සලකා බැලීමේදී, පෙත්සම්කරු මේ වන විට ඔහුගේ දරුවන් ඉහත කී වගඋත්තරකාර විදුහල්පති සේවය කරන පාසලෙන් ඉවත් කර ගෙන වෙනත් පාසලකට

ඇතුළත් කර ගෙන ඇති වුවද, එම දරුවන්ට අධ්‍යාපන කටයුතු හැදෑරීමට අවස්ථාව ලැබී තිබුණත්, එම දරුවන්ට පෙත්සම්කරු පවසන ආකාරයට ඔවුන්ගෙන් පදිංචි වී සිටින ස්ථානයේ ළගම තිබෙන පාසලෙන් ඉවත් කර දුරබැහැර පාසලට යැවීමට පාදක වූ හේතුව පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

පරීක්ෂණයේදී පෙත්සම්කරු විදුහල්පතිවරයාට එරෙහිව ඉහත කී චෝදනා එනම්, පෙත්සම්කරුගේ දියණියට විවිධ අවස්ථා වලදී විදුහල්පතිවරයාගෙන් මුහුණ දීමට සිදු වූ අකටයුතුකම් සහ මානසික හිංසනය පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

තවද අධ්‍යාපනය හදාරන ළමුන්ගේ මානසික තත්ත්වය ඉතා ඉහළ ස්ථානයක තිබිය යුතු අතර, පාසල තුළ විදුහල්පති සහ ගුරුවරුන්ගෙන් දරුවන්ගේ මානසිකත්වයට අයුතු ආකාරයේ හිංසනයන්ට මුහුණ දීමට සිදු වීම එකී දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට සෘජුවම බලපාන කාරණයක් වේ.

තවද පරීක්ෂණයේදී පෙත්සම්කරු බාහිර පුද්ගලයන් පංතිකාමරය තුළට ඇතුළු වීමට විදුහල්පතිවරයා විසින් අනුමැතිය ලබා දී ඇති බවට චෝදනා ඉදිරිපත් කළ අවස්ථාවේදී විදුහල්පතිවරයා නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීමෙන් පෙනී යන්නේ ඔහු එකී චෝදනාව පිළිගත් බවය.

ඉහත කී සියලු කරුණු කාරණා සලකා බැලීමේදී පැහැදිලි වන්නේ යම්තාක් මට්ටමකට විදුහල්පතිවරයා වෙතින් පෙත්සම්කරුගේ දියණියට අසාධාරණයක් සිදු වී ඇති බවත්, ඒ හරහා පෙත්සම්කරුගේ දියණියට නිදහසේ අධ්‍යාපන කටයුතු හැදෑරීමට බාධාවක් එල්ල වී ඇති බවත්ය. එබැවින් විදුහල්පතිවරයාගේ මෙම ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ අවධානය යොමු කර විදුහල්පතිවරයා පිළිබඳ විනය ක්‍රියාමාර්ගයක් ගැනීම සිදු කළ යුතු අතර, මෙවැනි සිදුවීම් මින් ඉදිරියට සිදු නොවීමට වගබලා ගැනීමටද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වගකීමක් බවද මානව හිමිකම් කොමිෂන් සභාව පෙන්වා දේ.

ඒ අනුව විදුහල්පතිගේ මෙම ක්‍රියාදාමය තුළ පෙත්සම්කරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ජේදයේ 11 වන ව්‍යවස්ථාව සහ 12(2) ව්‍යස්ථාවේ සදහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

ඒ අනුව, වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව සහ 12(2) ව්‍යවස්ථාවේ සඳහන් පෙත්සම්කරුගේ දියණියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, පෙත්සම්කරුගේ දරුවාට සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් වගඋත්තරකාර විදුහල්පතිවරයාට එරෙහිව විනයානුකූලව පියවර ගන්නා ලෙසට බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.24 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත =:

01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/